# වාරිමාර්ග අමාත්‍යාංශය

# ඇබෑර්තු

## මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

## අරමුදල් ප්‍රභවය : ආසියානු සංවර්ධන බැංකුව (ADB)

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන ආසියානු සංවර්ධන බැංකුව (ADB) සහ ශ්‍රී ලංකා රජය (GOSL) මගින් සපයන, සහනදායී ණය පහසුකම් සමග වාරිමාර්ග අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන මහවැලි බහු කාර්ය සංවර්ධන වැසටහනහි ප්‍රධාන සැලැස්මේ එක් කොටසකි.

**අයදුම්පත්**

පහත සඳහන් තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලබන අතර අයදුම්කරුවන්ට තම ජීවදත්ත විස්තර සහිත අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනකුගේ නම් හා ඇමතුම් අංක සහ අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද වැනි මූලික සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සමග 2023-12-11 දින හෝ ඊට පෙර කොළඹ - 10, ටී.බී.ජයා මාවත, නො. 493-1/1, මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනෙහි ව්‍යාපෘති අධ්‍යක්‍ෂ වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

කරුණාකර ලිපිකවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කරන්න. මීට අමතරව, එම අයදුම්පතෙහි පිටපතක් ලෙස, අයදුම් කරන තනතුර විෂය රේඛාවේ සඳහන් කොට hr.mwsip@gmail.com වෙත පිටපත් කරමින් pdadbproject@gmail.com මගින් ඉදිරිපත් කළ යුතුය.

| තනතුරු සහ රැකියා පැතිකඩ | සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|
| **1. ගණකාධිකාරී (PS-04 ප්‍රභේදය A) වැඩසටහන් කළමනාකරණ ඒකකය, - කොළඹ.**<br>**තනතුරු 02 යි**<br>**රැකියා පැතිකඩ 01**<br>වැඩසටහනෙහි මූල්‍ය හා ගිණුම්කරණ පද්ධතීන් පිළියෙල කොට නඩත්තු කිරීම, සැලසුම්කරණය, අයවැයකරණය, ලෙජර් පවත්වාගෙන යාම, ගෙවීම් හා අභ්‍යන්තර පාලනයන්, මූල්‍ය වාර්තා හා වියදම් ආපසු ගෙවීමේ ලිපිලේඛන, පිළියෙල කිරීම, ගබඩා කළමනාකරණ ක්‍රියාපටිපාටි, සත්‍යාපනය, සහ විගණන වාර්තා සහ MWSIP කළමනාකාරිත්වයට අවශ්‍ය මුදල් ආශ්‍රිත වෙනත් ඕනෑම පැවරුම්, කාර්යයන් සඳහා මුදල් කළමනාකරු හට සහායවීම.<br>**රැකියා පැතිකඩ 02**<br>මුදල් හා ගිණුම්කරණ පද්ධතියක් සැකසීමේලා මුදල් කළමනාකරුහට සහායවීම, ADB, CB ගෙවූ මුදල් මෙහෙයවීම, ණය හා සම්බන්ධ වාර්තා නඩත්තු කිරීම, වියදම් ප්‍රකාශ හා ADB මාර්ගෝපදේශ හා ක්‍රියාපටිපාටි පරිදි වෙනත් ප්‍රතිසන්ධානයක් ඉදිරිපත් කිරීම බාධා රහිත පහසු ක්‍රියා කාරිත්වය සඳහා අරමුදල් තිබෙන බවට සහතික වීම, ADB හා GOSL විගණනය සමාලෝචනය සඳහා වාර්තා හා ලිපිලේඛන ඉදිරිපත් කිරීම, අවශ්‍ය පරිදි ගෙවීම් සහතිකකරලීම සහ MWSIP කළමනාකාරිත්වයට අවශ්‍ය මුදල් සම්බන්ධ වෙනත් ඕනෑම පැවරුම් කාර්යයන් සඳහා මුදල් කළමනාකරු හට සහාය වීම. | ● පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් මට්ටම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 හා අනුකූලවේ<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව නිමාකළ ප්‍රථම උපාධිය<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකම්<br>**සමග**<br>අදාළ ක්ෂේත්‍රයේ අඩුතරමින් වසර 09 පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br>2. ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III/II හෝ ඉහළ පංතියේ නිලධාරියකුවීම හෝ අදාළ ක්ෂේත්‍රයේ සමාන තරාතිරමක නිලයක් දැරීම.<br>**සමග**<br>III/II පංතියේ අඩුතරමින් වසර 09 ක පළපුරුද්ද<br>(වැටුප් මට්ටම : PS04, ප්‍රභේදය - A - රු. 155,000.00 - රු. 170,000.00)<br>(වැය ගිණුම් ප්‍රකාශය (SOE) අධීක්‍ෂණය කොට පිරික්සීම හා ආපසු ගැනීමේ / ඉල්ලා අස්කරගැනීමේ ඉල්ලුම්පත් ණය දෙන නියෝජිතායතන හා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම සහ වාරික මුදල් ප්‍රවාහ අවශ්‍යතාවයන් සහ ස්ථාපිත ණය දෙන නියෝජිතායතන ක්‍රියා පටිපාටි හා මාර්ගෝපදේශ අනුව විදේශ ආධාර ලබන ව්‍යාපෘති පිළිබඳ වාර්තා පවත්වාගෙන යෑම පිළිබඳ පළපුරුද්ද අමතර වාසියකි. |
| **2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නිලධාරී (PS05) වැඩසටහන් කළමනාකරණ ඒකකය**<br>**තනතුරු 01 යි**<br>**රැකියා පැතිකඩ**<br>● වැඩසටහන් කළමනාකරණ ඒකකය (PMU) / ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සහ වැඩසටහන් කළමනාකරණ, සැලසුම් හා අධීක්ෂණ උපදේශන (PMDSC) සඳහා මිල දී ගැනීමට නියමිත සියලුම ICT සම්බන්ධ උපකරණවල පිරිවිතර පිළියෙල කිරීම.<br>● PMU සියලුම ව්‍යාපෘති කාර්යාල සහ PMDSC සම්බන්ධීකරණ ජාල හා මෘදුකාංග සබැඳි කරුණු ජාලගත හා සේවා කළමනාකරණය<br>● පරිගණක, යූපීඑස් (UPS) උපකරණ බහු ක්‍රියාකාරී කළු සහ සුදු / වර්ණ ඡායාපිටපත් යන්ත්‍ර, ප්‍රින්ටර් ජාල, ලිපිගොනු සේවා, CCTV පද්ධති සහ PMU හි PABX පද්ධතිය නඩත්තු කිරීම.<br>● ICT සබැඳි සියලුම උපකරණ සඳහා අනුකූලතා සහතික නිකුත් කිරීම.<br>● PMU, PIU හා PMDSC සඳහා ICT සබැඳි භාණ්ඩ ප්‍රසම්පාදනයට සම්බන්ධ ලංසු ඇගැයීම සඳහා තාක්ෂණ ඇගයීම් කමිටුවේ (TEC) සාමාජිකයකු ලෙස කටයුතු කිරීම.<br>● MWSIP නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.<br>● පරිසරය හා නැවත පදිංචි කිරීම හා සම්බන්ධ සිතියම් සහ PMU හා PIU ඒකක සඳහා GIS සිතියම් පිළියෙල කිරීම<br>● වයඹ පළාතේ ඇළමාර්ග ව්‍යාපෘතිය (NWPCP) සහ උතුරුමැද පළාතේ ඇළ මාර්ග ව්‍යාපෘතිය (NCPCP) - PIU පුනරුත්ථාපනය කිරීම සඳහා දත්ත සමුදය නිර්මාණය කොට පාලනය කිරීම.<br>● PMU / PIU සඳහා පරිගණක වැඩසටහන් සැලසුම් කිරීම.<br>● පරිගණක මෙහෙයුම් පිළිබඳ PMU/PIC කාර්ය මණ්ඩල පුහුණු කිරීමෙහි ලා සහාය වීම.<br>● වීඩියෝ සම්මන්ත්‍රණ මෙවලම් Zoom සහ Ms Teams මගින් අතත්‍ය (Virtual) රැස්වීම් සංවිධානය කිරීම. | ● පහත සඳහන් සුදුසුකම්, පළපුරුද්ද හා වැටුප් මට්ටම් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2019 හා අනුකූලවේ<br>1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධිය<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සුදුසුකමක්.<br>**හෝ**<br>අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකම්<br>**හෝ**<br>තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය අභ්‍යාස ආයතනයකින්, අදාළ ක්ෂේත්‍රයේ සබැඳි තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩුතරමින් වසර 06 ක පළපුරුද්ද<br>2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්‍ෂණික / වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ සබැඳි තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 6 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩුතරමින් වසර 11 ක පළපුරුද්ද.<br>3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණික / වෘත්තීය ආයතනයකින් අදාළ ක්ෂේත්‍රයේ සබැඳි තනතුරක් සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් 5 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.<br>**සහ**<br>අවශ්‍ය විශේෂඥතා පරාසයේ අඩුතරමින් වසර 16 ක පළපුරුද්ද<br>වැටුප් මට්ටම : PS 05 - රු. 105,000.00 - රු. 113,000.00) |

● ඉහත විස්තර කොට ඇති වැටුපට අමතරව අංක 01/2019 MSD චක්‍රලේඛය පරිදි ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.

**පොදු කොන්දේසි**

1. අයදුම්කරුවන් වයස අවුරුදු 64 ට අඩුවිය යුතුය.
2. සියලුම නිලධාරීන් අදාළ රාජ්‍ය ආයතන හා අනෙකුත් නියෝජිතායතන හා සමග සහයෝගයෙන් හා සමායෝජනයෙන් තම රාජකාරී ඉටුකරනු ඇතැයි බලාපොරොත්තු වේ.
3. ශ්‍රී ලංකාව තුළ විදේශ අරමුදල් ලබන ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද අමතර වාසියක් වනු ඇත.
4. ඉංග්‍රීසි භාෂා නිපුණතාව, රජයේ රෙගුලාසි පිළිබඳ දැනුම්වත් වීම සහ පරිගණක සාක්ෂරතාව මෙම තනතුරු සඳහා අත්‍යාවශ්‍ය පූර්වාවශ්‍යතාවයන් වේ.
5. රැකියා කොන්ත්‍රාත්, කාර්යසාධනය හා වැඩසටහන් / ව්‍යාපෘතිවල අවශ්‍යතාවයන් මත අලුත් කළ හැකි, එක් වසරක කාලයක් සඳහා වේ.
6. රජයේ අනුමත වැටුප් පරිමාණයන්, කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හා ඉන්පසු යම් සංශෝධනයක් පරිදි දීමනා සහිතව හිමිවේ.
7. අමතර දිගු වේලාවන් හා සති අන්තයන්හි වැඩ කිරීමට හැකියාව.

ඉහළ සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තු ගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර, කුසලතා මත පදනම්ව තෝරාගැනීම් සිදු කෙරේ. එබැවින්, බඳවා ගැනීමේ ක්‍රියාදාමයට යම් බලපෑමක් ඇතිකිරීම හෝ නියෝජනයන් සිදු කිරීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත. රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / සමුපකාර සහ වෙනත් රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තමන් තෝරාගනු ලැබුවහොත් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2019 හි 2.3.3 (අ) හෝ 2.3.3 (ආ) ඡේදයන්ට අනුකූලව අයදුම්කරුවන්ට පූර්ණ කාලීන වැටුප් රහිත පදනම මත මුදාහැරිය හැකි බව සඳහන් කරන ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකරමින් ඉදිරිපත් කරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

**ලේකම්,**

**වාරිමාර්ග අමාත්‍යාංශය.**